## ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - 2016

---------------------------------------------------

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරීත්ව වාර්තාව, ස්කන්ධය වෙනස්වීමේ වාර්තාව සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1996 අංක 26 දරන බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ සහ 2012 අංක 15 දරන ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 46 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායානන් වහන්සේ වෙත 2017 සැප්තැම්බර් 12 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට **(ISSAI 1000–1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද, ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය වටිනාකම රු. 77,958,181 ක් වුවද මූල්‍ය ක්‍රියාකාරීත්ව වාර්තාවේ එය රු.78,035,323 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය රු. 77,142 ක් වැඩියෙන් සහ ස්ථාවර වත්කම්වල ශුද්ධ අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂවලට අදාළ පුස්තකාල පොත් හා ගෘහභාණ්ඩ සමුච්චිත ක්ෂය වටිනාකම රු.18,212,891 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.17,900,789 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් දේපල, පිරියත හා උපකරණ ශුද්ධ අගය හා සමුච්චිත ලාභය රු. 312,102 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ආදායම් ප්‍රකාශනයේ මෙහෙයුම් ආදායම් යටතේ දක්වා ඇති ප්‍රාග්ධන අරමුදල් හායන වටිනාකම රු. 40,212,796 ක් වුවද ගණනය කිරීම් අනුව එය රු. 42,245,055 ක් වීමෙන් රු. 2,032,259 කින් වර්ෂයේ ඌනතාවය වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පරීක්ෂාවේදී පහත සඳහන් දෝෂ නිරීක්ෂණය වූයෙන් එහි තුල්‍යතාවය සම්බන්ධයෙන් විගණනයේදී ගැටළු සහගත විය.

(i) සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග හා තෑගි අරමුදලට මුදලින් ලද වටිනාකම රු. 126,382ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු. 1,498,883ක් ලෙස දක්වා තිබීම.

(ii) ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ මුදලින් දැරූ සත්‍ය වියදම රු.346,762,201 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු. 346,721,125ක් ලෙස දැක්වීම හේතුවෙන් මුදල් ගලා යෑම් රු. 41,076 ක් අඩුවෙන් දක්වා තිබීම.

### 2.3 ගෙවිය යුතු ගිණුම්

--------------------

වර්ෂ 02 සිට වර්ෂ 05 දක්වා කාලයක සිට පැවත එන එකතුව රු. 636,742 ක් වටිනා ණයහිමි ශේෂ 06ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| **(i)** මුදල් රෙගුලාසි 134(3) | අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත යොමුකර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571(2) | 2014 වර්ෂයට අදාළ රු. 122,927 ක් වටිනා ටෙන්ඩර් ඇප තැන්පතු, රු. 2,000ක් වටිනා පුස්තකාල පොත් සඳහා වූ ඇප තැන්පත් හා කල් ඉකුත් වූ රු. 7,891ක් වටිනා සේවක ඇප තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2010 ඔක්තෝබර් 15 දිනැති අංක 932 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 02 ඡේදය | විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන බාහිර උපාධි පාඨමාලාව, බාහිර බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව, බාහිර ඉංග්‍රීසි පාඨමාලාව හා තොරතුරු තාක්ෂණ පාඨමාලා යන බාහිර පාඨමාලාවන් එක් ස්ථානයකට කේන්ද්‍ර ගතකොට පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 52,229,436 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 36,199,372 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 16,030,064 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ පුද්ගල පඩි නඩි වියදම් රු. 19,333,966 කින් ඉහළයාම සහ වාර්ෂික ක්ෂය ප්‍රතිපාදනය රු. 17,092,875 කින් ඉහළ යෑම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට වර්ධනය වූ ඌනතාවයක් පැවති අතර 2015 වර්ෂය හා සැසඳීමේදී 2016 වර්ෂයේදී එම ඌනතාවය සියයට 44 කින් වැඩි වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2012 වර්ෂයේදී රු. 53,963,421 ක් වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී තිබුණු අතර 2015 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් එය රු.137,562,822 ක් හා රු.157,959,599ක් වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**
**--------------------------------**

**4.1 කාර්යසාධනය**
**-----------------**

1996 අංක 26 දරන බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතින් සංශෝධිත 2012 අංක 15 දරන ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව, බුදුන්වහන්සේගේ ඉගැන්වීම් වලට අනුකූලව ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම, බෞද්ධ භාවනාව පිළිබඳ පුහුණුව හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම, ථේරවාදී බුද්ධ ධර්මය ශ්‍රී ලංකාවේ හා විදේශ රටවල ප්‍රචාරය කිරීමට ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම හා බෞද්ධ සංස්කෘතිය සහ එහි අගයන් ප්‍රවර්ධනය කිරීම විශ්වවිද්‍යාලයේ අරමුණු වන අතර එම අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) අධ්‍යයන කාර්යසාධනය**
-----------------------------

(i) 1996 අංක 26 දරන බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ 16(4) ඡේදය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු පාලනය හා සාමාන්‍ය විධානය සනාතන සභාව සතුව පැවතුණි. එහෙත් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය සාධනය පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය ලිඛිත වාර්තා සනාථන සභාව වෙත ලබාගැනීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වාදී නොතිබුණු බැවින් විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨයන්ට අදාළ අධ්‍යයන කාර්යසාධනය සනාථන සභාව විසින් විධිමත්ව පරීක්ෂාකර නොතිබුණි.

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් හඳුන්වා දී තිබූ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අධ්‍යාපනික වගකීම් සඳහා ක්‍රියාපටිපාටිය (Loads of practices on academic accountability for academic staff in SriLankan University System) යටතේ වූ වැඩ ප්‍රතිමාන (Work norms) අනුව, අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙත වැඩ ධාරිතාවය පැවරීම සඳහා හා ඇගයීම සඳහා එම මාර්ගෝපදේශ සංග්‍රහය පිළිගැනීම හෝ විශ්වවිද්‍යාලයට සුදුසු ආකාරයට එය ආදේශ කර සකස්කර භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් අධ්‍යයන කාර්යසාධනය ඇගයීමට අවශ්‍ය මිනුම් දඬු විශ්වවිද්‍යාලය සතුව නොපැවතුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ සමාසික 02කට අදාළව අධ්‍යයන කාර්ය මණ්ඩල දේශක ස්වාමීන් වහන්සේලා 38 නමකගේ පෞද්ගලික කාලසටහන් විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් අධ්‍යයන කාර්යසාධනයට අදාළ අවම වැඩ ධාරිතාවය ඉටුකර ඇති බවට තහවුරුවක් ලබා ගැනීමට නොහැකි විය.

(iv) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අංශ 04හි විෂයන් 50කට අදාළව සමාලෝචිත වර්ෂයේ සමාසික 02 හි පවත්වා තිබූ දේශන ප්‍රමාණය, පැවැත්වීමට අපේක්ෂිතව පැවති දේශන ප්‍රමාණයට වඩා සියයට 68 සිට සියයට 86 දක්වා අඩු මට්ටමක පැවතුණි.

(v) විශ්වවිද්‍යාල පනතේ ප්‍රධාන පරමාර්ථයක් වන විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා අතර බෞද්ධ භාවනාව පිළිබඳ පුහුණුව හා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමට, අදාළ පාඨමාලා වෙනුවෙන් සෑම අධ්‍යයන වර්ෂයකම පළමු සමාසිකය තුළ පමණක් වසරකට දේශන හා ප්‍රායෝගික පුහුණුව සඳහා පැය 60ක් වෙන් කර තිබුණු අතර එම පැය ප්‍රමාණය වසරක් තුළ පැවැත්විය හැකි සමස්ත දේශන පැය ප්‍රමාණයට සාපේක්ෂව සියයට 10 ක් වැනි අඩු අගයක් ගෙන තිබුණි. එහෙත් දෙවන සමාසිකයටද බෞද්ධ භාවනාව අනිවාර්යය වන පරිදි පාඨමාලා ඒකක ඇතුළත් කරමින් ආයතනයේ බෞද්ධ භාවනාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණ වඩා ඵලදායීව ඉටු කර ගැනීම කෙරෙහි කළමණාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(vi) "සතිපට්ඨාන භාවනා ක්‍රමය" අනුව විශ්වවිද්‍යාලයේ පාඨමාලා තුළ භාවනාව හඳුන්වා දීමටත් භාවනා ක්‍රමයේ ප්‍රායෝගිකත්වය ප්‍රකට කිරීමටත් ඉලක්ක කර තිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 12 ක් ඉක්මවූ වියදම් දරා විශ්වවිද්‍යාල පරිශ්‍රයේ උද්‍යාන අලංකරණය සිදුකර තිබූ නමුත් ඒ තුළ සතර සතිපට්ඨානය පුහුණු කිරීමට භික්ෂූන් වහන්සේලාට සුදුසු ස්ථාන නිර්මාණය කර දීමට කළමණාකරණය අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(vii) පාඨමාලා ඒකක අතරින් සූත්‍රගත ධර්ම, විනය, අභිධර්මය යන බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කර ඇති අසූහාර දහසක් ධර්මස්කන්ධයෙන් කොපමණ ප්‍රමාණයක් විශ්වවිද්‍යාලයේ එක් එක් අධ්‍යයන අංශවල උපාධි පාඨමාලා තුළින් ඉගැන්වීම් කරන්නේද යන්න පිළිබඳ නිශ්චිත තහවුරුවක් ලබා ගැනීමට නොහැකි විය. එබැවින් පනතේ දැක්වෙන "බුදුන් වහන්සේගේ ඉගැන්වීම් වලට අනුකූලව ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම"කොතෙක් දුරට ඉටුවී ඇද්ද යන්න පිළිබඳ තහවුරුවක් ලබා ගැනීමට නොහැකි විය.

**(ආ) පුස්තකාල පොත් භාවිතය**

------------------------------

පුස්තකාල භාවිතය පිළිබඳව සිදුකරන ලද විගණන පරීක්ෂණයට අනුව, විශ්වවිද්‍යාල ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා තම අධ්‍යයන කටයුතු වලට අදාළව පුස්තකාල භාවිතය තුළින් ස්වයං අධ්‍යයනය ඉතා අඩු මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. එම තත්ත්වය මඟ හරවා ගැනීමට අවශ්‍ය උපාය මාර්ගික සැලසුම් තුළින් පුස්තකාල භාවිතය දිරිගැන්වීම සඳහා පාඨමාලා සංවර්ධනය කිරීමක් දක්නට නොතිබුණි.

## 4.2 අධ්‍යයන කාර්ය මණ්ඩල හා භෞතික සම්පත් ඌන උපයෝජනය

--------------------------------------------------------------------------

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පීඨ දෙකෙහි පැවැත්වෙන පාඨමාලාවල වෛකල්පිත විෂයයන් පළමු වසරේ සිටම තෝරාගැනීමට අවස්ථාව ලබාදීම හේතුවෙන් එම පාඨමාලාවල විෂයයන් 35ක පමණ දේශන සඳහා සහභාගිවන ශිෂ්‍ය සංඛ්‍යාව 1 සිට 11 දක්වා ඉතා අඩු අගයක් ගෙන තිබුණි.

## 4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා සපයා ඇති නේවාසිකාගාර දෙකක හා නිල නිවාසයක පරිභෝජනය කරන ජලය හා විදුලිය වෙනුවෙන් එම නේවාසිකාගාර භාවිතා කරන කාර්ය මණ්ඩල වලින් අයකරගත යුතු රු. 1,483,577 ක් විශ්වවිද්‍යාලය විසින් දරා තිබුණි.

## 4.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රධාන පිවිසුම් දොරටුව හා ආරක්ෂක කුටි 02ක් ඉදි කිරීමට අදාළව සිදුකරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුව කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලට අනුරූප CIDA/ICTAD ලියාපදිංචි ශ්‍රේණිය C 06 වුවද, ඊට පටහැනිව C 05 ලෙස දක්වා මිල ගණන් කැඳවා තිබුණි. ඒ අනුව තරඟකාරී මිල ගණන් ලබා ගැනීමට නොහැකි වී තිබූ අතර එක් ලංසුකරුවෙකු පමණක් ඉදිරිපත් කරන ලද මිල පදනම් කරගෙන රු.16,500,000ක මුදලකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ රු. 298,243,258ක වියදමින් ඉදිකර තිබුණු සිව් මහල් පුස්තකාල ගොඩනැගිල්ලේ වටිනාකම තුළ රු.2,723,025 ක් වූ ඉටු නොකල වැඩ විෂයයන් 03ක් හා අනුමත ප්‍රමිතියෙන් බැහැර ඉදි කිරීම් විෂයයන් 04ක් සඳහා සාවද්‍ය ලෙස නිර්දේශ කර කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබුණු අතර විගණනයෙන් පෙන්වා දීමෙන් පසු එයින්

වැඩ විෂයන් 02ක් නිවැරදි කර තිබුණි. ඉටුකර නොතිබූ අනෙකුත් කාර්යයන් සඳහා තවදුරටත් රු. 3,243,069 ක් රඳවාගෙන තිබූ නමුත් සාවද්‍ය ගෙවීම් නිර්දේශ කල නිලධාරීන්ට එරෙහිව සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතුකර නොතිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධ්‍යයන කාර්යය මණ්ඩලයේ තනතුරු 12 ක් පුරප්පාඩුව පැවතුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත විගණනයට ඉදිරිපත් කල යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කරන ලද්දේ 2017 ජුලි 04 දින දීය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායානන් වහන්සේගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව තරඟකාරී මිල ගණන් මත කොන්ත්‍රාත් නොපැවරීම. |
| (ආ) | අධ්‍යයන කාර්ය සාධනය | අධ්‍යයන කාර්යසාධනය ඇගයීම සඳහා සුදුසු මිනුම් දඬු සකස්කර නොතිබීම හා අධ්‍යයන කාර්ය සාධනය ඇගයීමට ලක් නොකිරීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබීම. |